# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2186/28 - 2020 ජූලි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2020.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv)(A).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු, 27(1) වන වගන්තිය යටතේවන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, ශ්‍රී ලංකාවේ, කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, (2020 ජනවාරි මස 30 වැනි දින අංක 2160/42 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත පරිදි වූ) 2006 ජූනි මස 09 වැනි දින අංක 1448/27 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන “ වෛද්‍ය පීඨය” යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන “19. නිර්වින්දන සහ දැඩි සත්කාර අධ්‍යයන අංශය” යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :

“20. වෛද්‍ය තාක්ෂණ අධ්‍යයන අංශය”.

**ආචාර්ය බන්දුල ගුණවර්ධන,**
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 ජූලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

08-300

1A - PG 5076 - 518 (2020/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.